Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### සහකාර වේත්‍රධාරී තනතුර

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ "සහකාර වේත්‍රධාරී" තනතුරෙහි පවතින පුරප්පාඩුවක් සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් 2018 ජූලි මස 24 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. "සහකාර වේත්‍රධාරී " යනුවෙන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය.

(මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය)

1. වැටුප් පරිමාණය :

   2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 58,295 - 3 x 1,335 / 8 x 1,630 / 2 x 2,170 - රු. 79,680 වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ මූලික ආරම්භක දළ මාසික වැටුප රු. 100,000.00 පමණ වේ.)

2. වයස :
   ඉල්ලුම්පත් කැඳවීම අවසාන වන දිනට වයස අවුරුදු 28 ට නොඅඩු සහ 40 ට නොවැඩි විය යුතුය.

3. අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද :
   පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම;

   සහ

   සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවක (නිත්‍ය) හෝ ශ්‍රී ලංකා පොලිස් සේවයේ අවුරුදු 8 කට නොඅඩු සම්මානනීය සේවාවක් ඇති ශ්‍රී ලංකා යුධ හමුදාවේ කපිතාන් තනතුරකට හෝ ශ්‍රී ලංකා පොලිසියේ සහකාර පොලිස් අධිකාරි තනතුරකට හෝ ඊට නොඅඩු තත්ත්වයේ තනතුරක් දරන අයකු විය යුතුය.

4. බඳවා ගැනීමේ ක්‍රමය :
   සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

5. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි :

   (i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්කරනු ඇත.

   (ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

   (iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය. ඔවුන් වෛද්‍ය පරීක්ෂණයකට ද භාජනය විය යුතුය.

   (iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

6. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ.) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළයුතුය.

   (අ) උප්පැන්න සහතිකය,
   (ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
   (ඇ) වෘත්තීමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
   (ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

7. දැනටමත් රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

8. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසු කමක් වනු ඇත.

9. අයදුම් පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරැදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

10. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඩබ්. එම් එන්. පී. ඉද්දවල,
වැඩබලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්

2018 ජූනි මස 28 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

*සහකාර වේත්‍රධාරී තනතුර*

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) :————. (මයා/ මිය/ මෙනෙවිය)
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්) :————.
(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-
(Mr./Mrs./Miss) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. (අ) පෞද්ගලික ලිපිනය :————.
දුරකථන අංකය :————.
(ආ) කාර්යාලීය ලිපිනය :————.
දුරකථන අංකය :————.

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළයුතු ලිපිනය ඃ

පෞද්ගලික ☐ කාර්යාලයීය ☐

04. (i) උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
(ii) 2018 ජූලි මස 24 වැනි දිනට වයස ඃ- අවුරුදු :————., මාස :————., දින :————.

05. විවාහක/අවිවාහක බව :————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව :————.

08. අධ්‍යාපන සුදුසුකම් ඃ- (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

| විභාගය | විෂයය | සාමාර්ථය | වර්ෂය | විෂයය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|---|---|---|
| අ.පො.ස (සා/පෙළ) | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| අ.පො.ස (උ/පෙළ) | | | | | | |
| | | | | | | |

09. උසස් අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)
විශ්ව විද්‍යාලය :————.
උපාධිය හා වර්ෂය :————.

10. වෘත්තීය සුදුසුකම් ඃ- (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.) :————.

11. පළපුරුද්ද :- (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.) :————.

12. වත්මන් රැකියාව පිළිබඳ විස්තර :

(අ) ආයතනයේ නම හා ලිපිනය :————.

(ආ) මුල් පත්වීමේ දිනය :————.

(ඇ) දැනට දරන තනතුර :————.

(ඈ) මාසික මූලික වැටුප :————.

(ඉ) දීමනා :————.

(ඊ) දළ වැටුප :————.

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද?
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :————.

14. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? එසේ නම් එම විස්තර සඳහන් කරන්න. :————.

ම විසින් මෙම අයදුම්පතහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය*

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,
මෙම ආයතනයේ ................................තනතුර දරන,........................මයා/ මිය/ මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක.

————,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.